කොළඹ දිසා අධිකරණයේදී ය.

කොළඹ ලෝටස් පාරේ, අංක.55, කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ, හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන්,

තඩු අංකය : 217/CO

සහ

1982 අංක.18 දරණ සමාගම් පනතේ IX කොටස යටතේ අධිකරණය විසින් ඈවර කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වන කාරණය සම්බන්ධයෙන්,

නිහාල් ශ්‍රී අමරසේකර,
අංක.167/4, විපුලසේන මාවත,
කොළඹ 10.

පෙත්සම්කරු.

වර්ෂ 2006 ක්වූ නොවැම්බර් මස 17 වන දිනදී ය.

ස්වකීය නීතිඥවරුන් වන වී.ඩබ්ලිව්.කුලරත්න ඇසෝෂියේට්ස් යන නාමය, අභිධානය සහ විලාසය යටතේ නීතිඥ වෘත්තියෙහි යෙදී සිටින නීතිඥ යමුනා බාලසූරිය සහ ඇයගේ වෘත්තිය සහායිකා නීතිඥ විජයලක්ෂ්මි දිපානි තිරෝෂිනි විජේසේකර මගින් පෙනී සිටින ඉහත නම සඳහන් පෙත්සම්කරු සිය පෙත්සමෙන් මෙසේ ප්‍රකාශ කර සිටී.

1. (මෙහි මින්මතු සමහරතැන්හි "HDL" යනුවෙන් සඳහන් කරනු ලබන) හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම 1982 අංක.17 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදනයන් යටතේ 1983.03.15 දින යථා පරිදි සංස්ථාපිත සීමිත වගකීම් සහිත පොදු සමාගමකි.

2. HDL සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තේ, ගෞරවනීය ඔබතුමාගේ අධිකරණයේ, අධිකරණ බලසීමා ප්‍රදේශය ඇතුළත කොළඹ, ලෝටස් පාරේ, අංක.55, එච්ලන් චතුරශ්‍රය, හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ ය.

3. (අ) HDL සමාගමේ අනුදත් කොටස් ප්‍රාග්ධනය, එකක් රු.10/- බැගින් වූ සාමාන්‍ය කොටස් 60,000,000 කට බෙදුන රු.600,000,000/- කි.

(ආ) එහි නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය, එකක් රු.10/- බැගින් වූ සාමාන්‍ය කොටස් 45,226,141 කට බෙදුන රු.452,261,410/- ක් වන අතර එයින් රු.250,897,500/- ක

නාමමාත්‍ර අගයකින් යුත්, එකක් රු.10/- බැගින් වූ කොටස් 25,089,750 ක් අක්කර 7 රූඩ් 0 පර්චස් 12.5 ක විශාලත්වයෙන් යුත් නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් කට්ටි 2 ක 99 වසර අතුරු බද්දක ප්‍රාග්ධනායි වටිනාකමකට 1984 වසරේ දී කොටස්කර වෙත් කොට ඇත. එම ඉඩම් 1999 ජූලි මස දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් රජයට ආපසු පවාරණය කරන ලදුව, එකී 25,089,750 කොටස් ධාරකය සඳහා වන එම ප්‍රතිෂ්ඨාව නිශ්ඵලදායි වී නොගෙවූ ලෙස පැවති අතර එසේ පවතින්නේ ය.

4. (අ) HDL සමාගමේ අරමුණු එහි සාංගමික සංස්ථා පත්‍රයේ විදහා දක්වා ඇත.

HDL සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ සහ ව්‍යවස්ථාවලිය සංශෝධනය කරමින් වන 1990.12.21 දින යෝජනා සම්මුතියේ සත්‍ය පිටපත් පිළිවෙලින් **"P1(a)" සහ "P1(b)"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද මෙයට යාකරනු ලැබ ඇත.

(ආ) HDL සමාගමේ එකම ව්‍යාපාරික කටයුත්ත වූයේ, ඉහතකී නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් කට්ටි දෙකෙහි පිහිටි හිල්ටන් හෝටලය සංවර්ධනය කොට එය අයිතිව සිටීමටත් වන අතර, සීමාසහිත කෝර්නල් සහ සමාගම විසින් ගිවිසුම් මූලිකව කඩකරලීමේ හේතුවෙන් එකී ඉඩම් කට්ටි දෙකම 1999.07.26 දින දරන්නා වූ අංක.673 සහ 674 විශේෂ ප්‍රදාන පවාරණය කිරීමේ සාධන පත්‍ර මගින්, ගරු නීතිපතිතුමාගේ උපදෙස් මත නාගරික සංවර්ධන අධිකාරිය විසින් රාජ්‍ය ඉඩම් ආඥාපනතේ නියමයන් ප්‍රකාර රජයට පවාරණය කර ඇත.

අංක.673 සහ 674 දරණ විශේෂ ප්‍රදාන පවාරණය කිරීමේ සාධන පත්‍රවල සත්‍ය පිටපත් පිළිවෙලින් **"P2(a)" සහ "P2(b)"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අඩංගුවන්නක් ලෙස අයැද අමුණනු ලැබ ඇත.

(ඇ) ඒ අනුව සහ එමගින් HDL සමාගමේ හිල්ටන් හෝටලය දැන් පිහිටා ඇත්තේ HDL සමාගමට අයත් නොවන ඉඩම් කට්ටිවල වන අතර, HDL සමාගමට ඒ සඳහා බද්ද අයිතියක් ද නොමැත.

5. පෙත්සම්කරු;

(අ) සමාගමේ දායකයකු වූන අතර 1984.05.31 දින සිට එකක් රු.10/- බැගින් වන HDL සමාගමේ කොටස් 70,000 ක් දරන්නකු වේ.

පෙත්සම්කරුගේ කොටස් සහතිකයේ සත්‍ය පිටපතක් **"P3"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

(ආ) එය සංස්ථාපිත කිරීමේ සිට 1990 දෙසැම්බර් දක්වා HDL සමාගමේ අධ්‍යක්ෂකවරයකු වූහ. ඉන් ඉක්බිතව නැවතත් 1994 ඔක්තෝබර් සිට 2005 නොවැම්බර් දක්වා එහි අධ්‍යක්ෂකවරයකු වූ අතර 2004 ජූලි සිට 2005 නොවැම්බර් දක්වා එහි සභාපති ලෙස ද තිල දැරුවේ ය.

6. (අ) සමාගම "පාලනය කළ වැරදි සිදුකරන්නන්" විසින් HDL සමාගමට වංචාවක් සිදුකිරීමේ හේතු සාධක මත පෙත්සම්කරු විසින් 1990 සැප්තැම්බර් හිදී, කොළඹ දි.උ. 3155/විශේෂ දරණ ව්‍යුත්පන්න නඩුව පවරන ලද අතර, HDL සමාගම විසින් හෝ HDL සමාගම වෙනුවෙන් එවැනි මුදල් ගෙවීමට රාජ්‍ය ඇපකර නිකුත් කර තිබුන රජය විසින් හෝ හිල්ටන් හෝටලය ඉදිකල ජපන් කොන්ත්‍රාත්කරුවන්ට කිසිදු හෝ මුදලක් ගෙවීම වලක්වාලමින් 1991 ඔක්තෝබර් හිදි දිසා අධිකරණය විසින් අතුරු ඉන්ජන්ෂන් තහනම් නිකුත් කරන ලෙදුව 1992 දෙසැම්බර්හිදී එම අතුරු ඉන්ජන්ෂන් තහනම් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කර සිටින ලදි.

(ආ) HDL සමාගමේ එවකට බංකොලොත් තත්වය කරණ කොට ගෙන, රජය HDL සමාගමේ කොටස් දරන්නකු ලෙස HDL සමාගම ඈවර කරලීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කිරීම රජය විසින් සලකා බලන බව මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් ගරු නීතිපතිතුමා වෙත 1990 මැයි මස දී දන්වමින් ගතයුතු පියවර පිළිබඳව උපදෙස් පතා සිටින ලදි.

> මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 1990 මැයි මස 25 වන දින දරණ ලිපියෙහි සත්‍ය පිටපතක් **"P4"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

(ඇ) පෙත්සම්කරුගේ ඉහත කී නඩුව සහ නිකුත් කළ අතුරු ඉන්ජන්ෂන් තහනම් හේතු කොටගෙන HDL සමාගම ඈවර කිරීමට වූන අරමුණ පිළිබඳව රජය එවකට ඉදිරි පියවර ගත්තේ නැත.

7. (අ) ඉහත කී නඩුව සමථයට පත්කිරීම සිදුකර ගැනීමට රජයේ වූ උත්සහයේ දී ගරු නීතිපතිතුමා විසින් සමථ ගිවිසුම් සකසා සමාප්ත කරන ලද අතර, එම සමථ ගිවිසුම් 1995 ජූනි මස දී අත්සන් කරන ලදුව, එම සමථය ගිවිසුම්වලට ගරු නීතිපතිතුමා විසින් සකසා සමාප්ත කරන ලද පාරිශිෂ්ඨයක පදනමක් මත, රජයේ පෙරුත්තය අනුව 1996 ඔක්තෝබර්හිදී සමථය ක්‍රියාවෙහි යොදවන ලදි.

(ආ) පෙත්සම්කරුගේ නඩුව හේතු කොටගෙන, ජපන් කොන්ත්‍රාත්කරුවන් විසින් රජය විසින් නිකුත් කර තිබුන ඇපකර මත රජයෙන් ඉල්ලා තිබුන ඔවුන්ගේ ඉල්ලීම්වලින් ජපන් යෙන් මිලියන 17,586 ක් (එවකට එක්සත් ජනපද ඩොලර් මිලියන 207 කට සහ ශ්‍රී ලංකා රුපියල් 10,200 කට සමාන මුදලක්) ඔවුන් විසින් 1995 ජූනි හිදි

කපාහැර, (මුලින් 1999 වන විට මුළුමනින්ම ගෙවිය යුතුව තිබුන) ඉතිරිය, 2010 වසර තෙක් වසර 15 ක කාල සීමාවක් ඇතුලත, (කලින් වර්ෂයකට 6% බැගින් වුන) අඩුකල වසරකට 5.25% බැගින් වූ පොලියක් සහිතව ගෙවීමට ප්‍රතිලේඛණගත කරන ලදි.

(ඇ) රජයෙන් කළ ඉල්ලීම්වලින් ජපන් කොන්ත්‍රාත්කරුවන් විසින් කරන ලද එම කපාහැරීම දණ්ඩන පොළිය සහතිව ඔවුන් විසින් ඉල්ලා සිටින ලද මුළු මුදල් ප්‍රමාණයෙන් 63.3% කට ගණනය වුන අතර දණ්ඩන පොළිය රහිතව, ඔවුන් විසින් ඉල්ලා සිටින ලද මුළු මුදල් ප්‍රමාණයෙන් 55.4% ක් වේ.

(ඈ) ඒ අනුව, පැමිණිලිකරු විසින් ගොනු කරන ලද කොළඹ දි.උ.අංක.3155/විශේෂ දරණ නඩුව හා HDL සමාගමේ 1990 මාර්තු මස වාර්ෂික ගිණුම් වාරණය කරමින් පවරන ලද කොළඹ දි.උ.අංක.3231/විශේෂ දරණ සම්බන්ධිත නඩුවද, ගරු නීතිපතිතුමා විසින් සකසා සමාප්ත කළ නියමයන් ප්‍රකාර 1996 ඔක්තෝබර් හිදි සමථයට පත්කොට ඉල්ලා අස්කර ගන්නා ලදි.

එකී නඩු දෙකෙහි ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශවල සත්‍ය පිටපත් පිළිවෙළින් **"P5(a)" සහ "P5(b)"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගතවත්තක් වශයෙන් අයැද යා කරනු ලැබ ඇත.

8. (අ) එයින් බලපෑමක් ඇති වූ පාර්ශවකරුවකු විසින් සමථය අත්හිටුවීමක් මුලින් සිදුකිරීම සහ පසුව එම අත්හිටුවීම අවලංගු කිරීම ද, එසේ බලපෑමක් තිබුන තවත් පාර්ශවකරුවකු වුන සීමාසහිත කෝර්නල් සහ සමාගම පීඩාකාරි නඩුහබ පවරා සිටීමද හේතුකොටගෙන HDL සමාගමට අලාභ පාඩු සහ හානි සිදුවිය. පූර්ණ ලෙස අනාවරණය කිරීමක් වශයෙන් එම නඩු වූයේ, කොළඹ දි.උ.අංක.4392/විශේෂ (නිෂ්ප්‍රභා විය), 4447/විශේෂ (නිෂ්ප්‍රභා විය), 4413/විශේෂ, 4414/විශේෂ, 4785/විශේෂ, 4791/විශේෂ සහ 5095/විශේෂ සහ මහාධිකරණ (සිවිල්) 1/1998(2)

(ආ) 4785/විශේෂ සහ 5095/විශේෂ දරණ නඩුවල අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නිකුත් කරන ලද අතර, ඉහත කී සමථය ප්‍රකාර ජපන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමට අභියාචනාධිකරණය විසින් අවසරය දුන් නමුත් එහි අනිකුත් කොන්දේසි ක්‍රියාත්මක කිරීම වලක්වාලන ලදි.

(ඇ) HDL සමාගමට ගෙවීමට නොහැකි වන බරපතල සහ භයානක ණයගැතියාවකට HDL සමාගම ඇදවැටෙනු ඇතැයි පෙන්වා දෙමින් <u>HDL සමාගමේ මූල්‍ය ප්‍රති ව්‍යුහකරණය සහ ප්‍රති සංවර්ධනය</u> ද ඇතුලත් වුන සමථය සමස්ථයක් වශයෙන් ක්‍රියාත්මක නොකොට එවැනි ගෙවීම් කරනවාට පෙත්සම්කරු විරුද්ධ විය.

9. (අ) අභියාචනාධිකරණය විසින් තිකුත් කරන ලද වෙනසක් සිදුකළ අතුරු ඉන්ජන්ක්ෂන් තහනමේ ප්‍රතිඵලයක් වශයෙන් කොළඹ දි.උ.අංක.3231/විශේෂ දරණ නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශයට (P5(b)) අනුකූලව, 1990 මාර්තු සිට, දැනට <u>වසර 16 කට</u> එහි විගණනය කළ වාර්ෂික ගිණුම් කොටස්හිමියන්ට බෙදාහැරීමෙන් HDL සමාගම වලක්වා ඇත.

(ආ) මෙහි විදහා දක්වා ඇති පරිදි HDL සමාගමේ, ගොඩගැනීමක් අපේක්ෂා කළ නොහැකි අරාජික බංකොලොත් තත්වය ගැන මහජනයා නොදැන නමුත් පෙත්සම්කරු තරයේ විශ්වාස කරන හැටියට, HDL සමාගමේ මූල්‍ය ප්‍රතිව්‍යුහකරණයක් සහිතව, සමර්ථක අපේක්ෂාවක් පවතින්නේ යැයි යන විශ්වාසයෙන් යුතුව, HDL සමාගමේ කොටස් දැන් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරු ස්ථානයේ "පැහැරහැරීම් මණ්ඩලයේ" වෙළඳගතව පවතී.

10. (අ) කොළඹ දි.උ 5095/විශේෂ සහ මහාධිකරණයේ (සිවිල්) 1/1998(2) නඩුවේ (සහ කොළඹ දි.උ.4785/විශේෂ සහ 4785/විශේෂ නඩුවලද) ජපන් කොන්ත්‍රාත්කරුවන් එමගින් ජපන් යෙන් මිලියන 17,856 (එවකට එක්සත් ජනපද ඩොලර් මිලියන 207 කට සහ ශ්‍රී ලංකා මුදලින් රුපියල් මිලියන 10,200 කට සමාන) මුදලක් කපා හැර ඇති, 1995 ජුනි මස එළඹි සමර්ථ ගිවිසුම් ශුන්‍ය කිරීමට සහ/හෝ බලාත්මක නොකරන ලෙසට සීමාසහිත කෝර්නල් සහ සමාගම අයැද ඇත.

(ආ) ඒ අනුව, සීමාසහිත කෝර්නල් සහ සමාගම අයැද ඇති පරිද්දෙන් එමගින් HDL සමාගමට සහ රජයට ද බරපතල පාඩු සහ අලාභ සිදුකරමින් ඉහත කී කපා හැරීම රහිතව රජයෙන් ඔවුන් ඉල්ලුම් කර සිටි සමස්ත මුදලටම ජපන් කොන්ත්‍රාත්කරුවන් හිමිකම් ලබන අතර එය ඉල්ලා සිටීමට ද ඔහුනට නිදහස ලැබෙනු ඇත.

(ඇ) ඒ අනුව ගිවිසුම් මූලික ලෙස කඩකිරීමේ සහ HDL සමාගමට සහ රජයට සිදුවූ අලාභය සඳහා කොළඹ දි.උ.5095/විශේෂ සහ මහාධිකරණයේ (සිවිල්) 1/1998(2) නඩුවල HDL සමාගම සහ පෙත්සම්කරු (සහ අංක.1/1998(2) නඩුවේ HDL සමාගමේ රජයේ අධ්‍යක්ෂකවරුන්) සීමාසහිත කෝර්නල් සහ සමාගමට එරෙහිව හරස් ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබ ඇත.

(ඈ) රජය සමඟ එළඹි ගිවිසුමේ නියමයන් ප්‍රකාර කොටස් ප්‍රාග්ධනය වශයෙන් HDL සමාගමට කළයුතු රුපියල් මිලියන 85.7 ක ගෙවීම සීමාසහිත කෝර්නල් සහ සමාගම පැහැර හැර ඇත. HDL සමාගමට හිල්ටන් හෝටලය මාර්ගයෙන් කළයුතු රුපියල් මිලියන 4.9 ක ගෙවීම කිරීම සී.එල්.පෙරේරා වසර ගණනාවක්ම පැහැර හැර ඇත.

මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 1990.08.10 සහ 1990.09.13 දිනයන් දරණ ලිපිවල HDL සමාගමේ 2004.09.30 දින අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ වාර්තාවේ සහ HDL සමාගමේ 2005.05.16 දින විගණන කමිටුවේ වාර්තා සටහන්වල සත්‍ය පිටපත් පිළිවෙලින් **"P6(a)", "P6(b)", "P6(c)" සහ "P6(d)"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් ලෙස අන්තර්ගත වන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

11. (අ) "සංශෝධිත සැලසුම්" වශයෙන් විස්තර තිබූ සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් 1986.04.29 දින අනුමත කර තිබුන, ආදේශ කරන ලද හෝටලයේ ගෘහ නිර්මාණ සැලසුම්වල මහල් පත්‍රවල නිරූපිත ආරෝපණ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද එම සැලසුම්වලම කොටසක් ලෙස සමන්විත වන හරස් කොට්ඨාශාකාර පත්‍රවල ඒවාට අනුරූප මහල් සම්බන්ධයෙන් නිරූපිත මහල් අරෝපනයම නොවන බව HDL සමාගමට සිදුකල ඉහත කී වංචාව විමර්ශනය කිරීමට බලය පරවන ලද විශේෂ ජනාධිපති කොමිසමක් අභියස විමර්ශන පවත්වන අතරතුරේ දී (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව දෙන ලද අවස්ථාවේ අනාවරණය වී නොතිබුන සිද්ධාන්තය) අනාවරණය විය.

(ආ) 3 වන සහ 4 වන මහලයන් මීටර් 24.5 ක එකම උස් ප්‍රමාණයකින් යුත් ලෙස පෙන්නුම් කර තිබුන අතර 19 වන මහල සහ 19 වන මහලයේ වහලය පිළිවෙලින් මීටර් 72.7 ක සහ මීටර් 72.5 ක උස් ප්‍රමාණයකින් යුත් බව පෙන්නුම් කර තිබුණි. මෙය සහජ නෛසර්ගික සිදුවිය නොහැක්කක් බවත් මෙවැනි සැලැස්මක් නාගරික සංවර්ධන අධිකාරියට අනුමත කලහැකිව තිබුනේ කුමන විධියකින්දැයි යන ප්‍රශ්ණය මතු කරමින් කොමිසම නිරීක්ෂණය කලේ ය.

(ඇ) තවද "පතුල් මහල්" නොමැතිවීම "සංශෝධිත සැලැසුම්" වල දී ඇති පත්‍රිකා අංකයන් අනාවරණය කරයි. එනම් අදාල පත්‍රිකා නොමැති ය.

(ඈ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2005 පෙබරවාරි මස හිදී "සංශෝධිත සැලසුම්" වශයෙන් විස්තර කර තිබූ ආදේශිත ගෘහ නිර්මාණ සැලසුම් පරීක්ෂාකර බලා ගෘහ නිර්මාණ සැලසුම් අක්‍රමවත් බව පිළිගනිමින් එනිසා ඇත්ත වශයෙන්ම ඉදිකර තිබෙන්නා වූ හෝටලයේ ගොඩනැගිලිවල "මිනුම් කල රූප සටහනක්" සකස් කිරීමට භාර ගනිමින් එය 2005 සැප්තැම්බර් හිදී එවන ලදි.

නාගරික සංවර්ධන අධිකාරියේ 2005.02.18 සහ 2005.09.07 දිනයන් දරණ ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **"P7(a)" සහ "P7(b)"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

12. (අ) එහි මුල් ආරම්භයේ සිට 2005 ජුනි දක්වා HDL සමාගමේ සභාපති සහ කළමණාකාර අධ්‍යක්ෂකව සිටි සහ පෙත්සම්කරු එළිදරව් කළ වංචාව පිළිබඳව කිනම් හෝ ආකාරයක ක්‍රියා මාර්ගයක් නොගත් එහෙත් පෙත්සම්කරුගේ උත්සාහයන්ට අවහිරතා පෑ සී.එල්.පෙරේරා කොළඹ දි.උ.අංක.4414/විශේෂ දරන නඩුවේ සීමාසහිත කෝර්නල් සහ සමාගම වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශයක් දිවුරා සිටිමින් එහි 56 සහ 59 ඡේදයන් හි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්ථිර කරනු ලැබූ කොළඹ දි.උ.අංක.3155/විශේෂ නඩුවේ පෙත්සම්කරු විසින් ගෙනහැර දක්වා තිබුන HDL සමාගමට සිදුකල වංචාව පිළිගත්තේ ය.

> "56. බැලූ බැල්මට පෙනෙන ප්‍රෝඩාවක් කර ඇති බව තහවුරු කර ඇතැයි ශ්‍රේෂ්ඨාධිකරණය දැනටමත් තීරණය කර ඇති අතර, කුමක් සිදුවූවත් අනුමාන යයි සිතිය හැකිපරිදි මිට්සුයි සහ තායිසේ විසින් සිදුකර ඇතැයි කියනු ලබන ප්‍රෝඩාව නඩුවේ දී සනාථ කරනු ලැබිය හැකි .......... බව මම තවදුරටත් පවසමි. (එසේ සඳහන් කර ඇත්තේ කොළඹ දි.උ.අංක.3155/විශේෂ දරණ නඩුවටය.")
>
> "59. මිට්සුයි සහ තායිසේ විසින් සිදු කරන ලද බැලූ බැල්මට පෙනෙන වංචාවක් ඔප්පු කර ඇතැයි මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැනටමත් නිරීක්ෂණය කර ඇති බවත්, හොටෙල් ඩෙවලපර්ස් නියෝජනය කරන්නා වශයෙන් එන්.එස්.අමරසේකර මහතා විසින් පවරන ලද එකී අංක.3155/විශේෂ නඩුවේ දී මිට්සුයි සහ තායිසේ විසින් කරන ලද වංචාව ඔප්පු වීමට දැඩි ශක්‍යතාවයක් ඇති බවත්, මම තවදුරටත් ප්‍රකාශ කරමි."

කොළඹ දි.උ.අංක.4414/විශේෂ දරණ නඩුවේ සී.එල්.පෙරේරා විසින් ගොනු කළ දිවුරුම් ප්‍රකාශයේ සත්‍ය පිටපතක් **"P8"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

(ආ) කෙසේ වුවද වෙනත් අයවළුන් අතර ඔහු වෙත විශේෂ ජනාධිපති විසින් කොමිසම චෝදනා ගෙනහැර දක්වමින් වෙනත් දේ අතර පහත සඳහන් පරිදි දක්වමින් හේතු දක්වා සිටීමේ නොතිසියක් 1995 දෙසැම්බර් හිදී නිකුත් කල පසුව, ඔහු විසින් 1998 මාර්තු මසදී කොළඹ දි.උ.5095/විශේෂ නඩුවේ ගොනුකළ දිවුරුම් ප්‍රකාශයේ 1995 ජූලි හිදී ගෞරවනීය ඔබතුමාගේ අධිකරණයට දිවුරා කී දෙයට හාත්පසින්ම වෙනස් සහ විරුද්ධ ස්ථාවරයක් ගෙන එම පිළිගත් වංචාව ප්‍රතික්ෂේප කර සිටියේ ය.

> *"ඔබ විසින් සිදුකල සහ/හෝ සිදු නොකල ඉහත කී ක්‍රියාවන් වංචනික වන අතර එකී සමාගමට සහ/හෝ එහි බහුතර කොටස්කරුගේ තත්වයෙන් ශ්‍රී*

*ලංකා රජයේ උන්නතියටත් හානිදායක වීමෙත් එකී සමාගමට සහ/හෝ ශ්‍රී ලංකා රජයට මූල්‍ය පාඩු සහ අලාභ සිදු කරන ලදි. "*

*"ඔබ විසින් සිදු කරන ලද සහ/හෝ සිදු නොකරන ලද ඉහතකී ක්‍රියා වංචනික ක්‍රියා වන අතර, එකී සමාගමට සහ/හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවට මුදලින් පාඩු හා හානි සිදු කෙරෙන එකී සමාගමේ සහ/හෝ බහුතර කොටස්හිමියාගේ තත්ත්වයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ යහපතට අහිතකර ක්‍රියා වේ."*

*"මෙහි මින් ඉහත සඳහන් කරන ලද කරුණු සම්බන්ධයෙන් සංශෝධිත පරිදි වූ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක.7 දරණ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 9 වන වගන්තියේ නියමයන් අනුව, ඔබ විසින් බලය වැරදිලෙස හෝ අනිසි ලෙස භාවිතා කිරීම සහ/හෝ දූෂණය සහ/හෝ වංචනික ක්‍රියා කිරීම වෙනුවෙන් වරදකරු නොකිරීමට ඇති නිදහසට කරුණු දක්වන ලෙස ඔබට මෙයින් නියම කරනු ලැබේ."*

එකී හේතු දක්වා සිටීමේ නොතිසියේ සත්‍ය පිටපත් **"P9"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

(ඈ) එක කොමසාරිස්වරයෙකු 1996 ජුනි හිදි බරපතල ලෙස රෝගාතුරුවීමෙන් විමර්ශනය සමාප්ත නොකළ අතර ඉන් ඉක්බිතිව, කොමිසමේ වරෙන්තු බලපත්‍රය අහෝසි විය.

13. (අ) කොළඹ දි.උ.අංක.5095/විශේෂ දරණ නඩුව හා සම්බන්ධ අභියාචනාධිකරණය විසින් දෙන ලද වෙනස්කල අතුරු ඉන්ජන්ක්ෂන් තහනමට එරෙහිව අභියාචනා කිරීමේ අවසරය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 1999 දෙසැම්බර් හිදි ප්‍රදානය කරන ලදි.

(ආ) ආනුෂංගිකව, 2000 ජුනි හෝ එයට ආසන්නයේ දී අභියාචනය පිළිබඳව වන කාරණය ශ්‍රේෂ්ඨාධිකරණය අභියස එළඹුන අවස්ථාවේ සමථයක හැකියාව ගැන සලකා බලන ලෙසට පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටින ලද අතර, එවැන්නක් ගවේෂණය කරන ලෙස ගරු නීතිපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදි.

(ඇ) මෙම හේතු සම්බන්ධතාවය මත ඉහත සඳහන් නඩු පසෙකින් තබා ඇත.

(ඈ) ගරු නීතිපතිතුමා පාර්ශවකරුවන් හා සාකච්ඡා කිරීමෙන් අනතුරුව 2001 අගෝස්තු මස දී ඔහුගේ වාර්තාව දෙන ලදි.

(ඉ) ඉන් ඉක්බිතිව, සමථයකට එළඹීමේ උත්සහයක යෙදීම සඳහා මහභාණ්ඩාගාරයේ ලේකම් විසින් 2002 අගෝස්තු මස දී කමිටුවක් පත් කරන ලදී. නමුත් සීමාසහිත කෝර්නල් සහ සමාගම සමඟ තීරණාත්මක සමාප්තයකට එළඹීමට නොහැකි විය.

(ඊ) අනුසාංඝිකව 2004 අගෝස්තු මස දී මහභාණ්ඩාගාරයේ ලේකම් විසින් සමථයක් සමාප්ත කිරීමේ උත්සහ දැරීමේ අභිලාෂයෙන් ඉහත කී කමිටුව ප්‍රතිසංස්ථාපනය කලේය. නමුත් සීමාසහිත කෝර්නල් සහ සමාගම සමඟ තීරණාත්මක සමාප්තයකට එළඹීමට නැවතත් නොහැකි විය.

(උ) මේ අතරතුරේ, HDL සමාගමේ රජයට ණයගැතියාව සහ HDL සමාගම වෙනුවෙන් දී තිබුන රාජ්‍ය ඇපකර මත ජපන් කොන්ත්‍රාත්කරුවන්ට වැඩිදුර ගෙවීම් කිරීමට වූන රජයේ බැඳියාව කරන කොටගෙන, රජය විසින් කැබිනට් මණ්ඩලය පත්තල ප්‍රමන්ත්‍රණ (NEGOTIATING) කමිටුවක් සංස්ථාපනය කලේ ය.

(ඌ) දිගුකාලීනව නිමාවකින් තොරව පැවති මෙම කාරණය 2005 ජුනි හිදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගන්නා ලදුව HDL සමාගම ප්‍රතිව්‍යුහය කිරීම සඳහා වූ රජයේ යෝජනාවේ අනුසාරයෙන් සමථයක් ගෙන ඒමට උත්සහයක් දරණ මෙන් මහභාණ්ඩාගාරයේ ලේකම්ගෙන් ඉල්ලා සිටින ලදී. එහෙත් සීමාසහිත කෝර්නල් සහ සමාගම සමඟ තීරණාත්මක නිමාවකට එළඹීමට නොහැකිවූයෙන් වසර 6 කට අධික කාලසීමාවකට පසුව, ඒ කාල වකවානුවේ දී සමථයක් කිරීමට ගත් උත්සහයන් ව්‍යර්ථ වීමෙන් අභියාචනය 2006.11.29 වන දින ඇසීමට නියම කෙරුණි.

ගරු නීතිපතිතුමාගේ 2001.08.22 දින දරණ වාර්තාවේ, භාණ්ඩාගාර ලේකම්ගේ 2002.08.06 සහ 2004.08.23 දිනයන් දරණ ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **"P10(a)", "P10(b)" සහ "P10(c)"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

14. කැබිනට් මණ්ඩලය පත්කල ප්‍රමන්ත්‍රණ (NEGOTIATING) කමිටුවක් විසින් 2005 ජූලි මස දී ක්‍රමවත්ව සකස් කෙරුණ HDL සමාගම මූල්‍යම වශයෙන් ප්‍රතිව්‍යුහය කිරීම සඳහා වූන යෝජනා ඉන් පසුව කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇත.

රජයේ යෝජනාවල සත්‍ය පිටපතක් **"P11"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

15. 2005 ජූලි මස රජයේ යෝජනා ("P11") ප්‍රකාර,

(අ) HDL සමාගමේ 2005.06.30 දිනට ශේෂ පත්‍රය මෙසේ දී ඇත.

| | | |
|---|---|---|
| | | (රුපියල් මිලියන වලින්) |
| ස්ථාවර වත්කම් | - | 2,139.2 |
| ජංගම වත්කම් | - | 744.6 |
| ජංගම වගකීම් | - | 271.6 |
| | | 473.0 |
| ශුද්ධ වත්කම් | - | 2,612.2 |
| කොටස් ප්‍රාග්ධනය | - | 452.2 |
| සංචිතය | - | 860.7 |
| (එකතුවූ පාඩු) | - | (6,351.5 |
| | | (5,038.6) |
| දිගුකාලීන බැඳියාවන් | - | 7,650.8 |
| අරමුදල් ප්‍රභවය | - | 2,612.2 |

(ආ) අංක.673 සහ 674 දරණ විශේෂ ප්‍රදාන පවාරණය කිරීමේ සාධන පත්‍ර ප්‍රකාර, හිල්ටන් හෝටලය පිහිටි ඉඩම් 1999 ජූලි මස 26 වන දින සිට රජයට අයිතිව පවතින සේ, නාගරික සංවර්ධන අධිකාරිය රජයට පවාරණය කරනු ලැබ ඇත.

16. 2005.06.30 දිනට ඒකරාශිවූ අතිවිශාල පාඩු ද සහිතව කොටස් ප්‍රාග්ධනය සහ සන්චිතයන් ද මුළුමනින්ම සෝදා පාළුවී, ගොඩදැමීමේ හැකියාවක් අපේක්ෂා කළ නොහැකි තරමට වූ HDL සමාගමේ ඉහත කී අරාජක බංකොලොත් තත්ත්වය, ජපන් කොන්ත්‍රාත්කරුවන්ට වාරික මුදල, ඒ මත පොලිය ද සහිතව, ගෙවීමත් සමඟ තවදුරටත් පිරිහී යනු ඇත.

17. HDL සමාගමේ බංකොලොත් තත්වය කරණකොට ගෙන, අරමුණු කර ඇති පරිද්දෙන් මූල්‍ය ව්‍යුහකරණය වහාම ක්‍රියාත්මක කළහොත් මිස, HDL සමාගම ඇවර කරනවා විනා අන් විකල්පයක් නොමැති බව 2005.03.31 දින පැවැති HDL සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පෙත්සම්කරු සභාපති වශයෙන් දැනුම් දී සිටියේ ය.

HDL සමාගමේ 2005.03.31 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාවේ සත්‍ය පිටපතක් **"P12"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වත්තක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

18. 2005 ජූලි මාසයේ රජයේ යෝජනා "P11" ප්‍රකාර

(අ) 2005.03.31 තෙක් වසර 7ක් පුරා HDL සමාගම අඛණ්ඩව දරා ඇති පාඩුව මෙසේ දක්වා ඇත.

| | | (රුපියල් මිලියන වලිනි) |
|---|---|---|
| 1999 | - | ( 188.9) |
| 2000 | - | ( 291.5) |
| 2001 | - | ( 223.8) |
| 2002 | - | ( 288.0) |
| 2003 | - | ( 240.0) |
| 2004 | - | ( 248.6) |
| 2005 | - | ( 400.8) |
| | | ( 1,881.6) |

(ආ) 2005.06.30 දිනෙන් අවසන් කාර්තුවට පාඩුව රුපියල් මිලියන 19.5 කි. ( රුපියල් මිලියන 92.2 ක විනිමය ප්‍රතිලාභයක් සහිතව)

19. 2005 ජුලි මාසයේ රජයේ යෝජනා "P11" ප්‍රකාර,

(අ) 2005.06.30 දිනට HDL සමාගම විසින් රජයට ගෙවීම පැහැර හැර ඇති ණය මුදල පහත සඳහන් පරිදි දක්වා ඇත.
HDL සමාගම විසින් රජයට ගෙවීම පැහැරහැර ඇති වත්මන් ණය මුදල් වන්නේ HDL සමාගමට මිට්සුයි සහ තායිසේ වෙත ගෙවීම් කිරීමට හැකිවනසේ මිට්සුයි සහ තායිසේ වෙත ප්‍රදානය කල රාජ්‍ය ඇපකර යටතේ රජය විසින් ගෙවා ඇති අත්තිකාරම් වන අතර, ඒ මත පොළිය ද ඇතුළත් වේ. (2005.06.30 දින දෙන ලද ණය මුදල හැරුණවිට) HDL සමාගම විසින් එකී පොළි සහ මුල් මුදල් ද ගෙවීම පැහැර හැර ඇත.

| ණය ගත් දිනය | මුල් මුදල (රු.) | පොළි අනුපාතිකය වසරකට (%) | පොළි (රු.) |
|---|---|---|---|
| 1997.07.02 | 288,567,633 | 12.50 | 451,834,732 |
| 1999.07.12 | 469,742,070 | 12.50 | 482,559,701 |
| 2000.07.03 | 464,427,826 | 12.50 | 372,486,197 |
| 2001.06.29 | 360,618,876 | 18.56 | 351,907,947 |
| 2002.07.01 | 446,803,874 | 12.50 | 189,368,048 |
| 2003.07.04 | 340,024,378 | 9.40 | 66,929,038 |
| 2004.06.30 | 395,658,959 | 8.59 | 33,987,105 |
| 2005.06.30 | 225,639,338 | 10.25 | ------- |
| එකතුව | 2,991,482,954 | | 1,949,072,768 |

රාජ්‍ය ඇපකර යටතේ HDL සමාගමට ප්‍රදානය කර ඇති ණය මුදල සම්බන්ධයෙන් මහභාණ්ඩාගාරයේ ලේකම්ගේ 1997.11.13, 1999.08.17, 2000.08.11, 2001.07.30, 2002.07.30, 2003.09.23, 2004.07.29 සහ 2005.07.19 දිනයන් දරණ ලිපිවල සත්‍ය පිටපත් පිළිවෙලින් **"P13(a)", "P13(b)", "P13(c)", "P13(d)", "P13(e)", "P13(f)", "P13(g)" සහ "P13(h)"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් සහ අන්තර්ගත වන්නක් ලෙස අයැද යා කරුනු ලැබ ඇත.

(ආ) ඉහත සඳහන් රුපියල් මිලියන 7,327.1 ක මුළු ණය මුදලට අමතරව, 2013 වන විට 2% ක සහනදායි පොලියක් මත ලංකා බැංකුවට ගෙවිය යුතු රුපියල් මිලියන 271.6 ක ඉතිරි සහනදායි ණය මුදලක් ද, රුපියල් මිලියන 52.1 ක පාරිතෝෂිත ප්‍රතිපාදනයක් ද, එකතුව රුපියල් මිලියන 7,650.8 ක් වේ.

(ඇ) 2005.06.30 දිනට HDL සමාගම විසින් ජපන් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු, රජය විසින් ඇපවී ඇති, ඉතිරි ණය මුදල් මෙසේ දක්වා ඇත.

| ගෙවිය යුතු දිනය | මුල් මුදල (ජපන් යෙන්) |
|---|---|
| 2006.06.30 | 522,278,522 |
| 2007.06.30 | 522,278,522 |
| 2008.06.30 | 522,278,522 |
| 2009.06.30 | 522,278,522 |
| 2010.06.30 | 522,278,522 |
| එකතුව | 2,611,392,610 |

(2005.06.30 දිනට) ජපන් යෙන් 1 බැගින් පරිවර්තනය කලවිට = රු.9,139/- ඉහත කී මුල් මුදල රු.2,386,551,761/- කට ගණනය වේ.
ඉහත උපලේඛණගතව ඇති පරිදි වාරිකයන් මඟින් ගෙවූ කල්හි, යෙදවිය යුතු පොළී අනුපාතය වසරකට 5.25% කි.

20. 2005 ජූලි රජයේ යෝජනා ප්‍රකාර වැඩිදුරටත් මෙසේ දැක්වේ.

(අ) කර ඇති ප්‍රක්ෂේපයන් ප්‍රකාර යෝජිත මූල්‍ය ප්‍රතිව්‍යුහරණය නොමැතිව 2010.03.31 වන විට රජය වෙත ගෙවිය යුතු පැහැර හැර ඇති ඇස්තමේන්තු කල රු.9,300,000,000/- ක ණය මුදලද ඒකරාශී වෙමින්, HDL සමාගම සැලකිය යුතු පාඩු දරමින් දිගටම කටයුතු පවත්වාගෙන යනු ඇත.

(ආ) පවත්නා තඩු හබයත් නිමාවට පත්කළ නොහැකිවේ නම්, සහ ඉහත දක්වා ඇති අනුසාරයෙන් යෝජිත මූල්‍ය ව්‍යුහකරණය වහාම ක්‍රියාවට නංවා නොසිටින්නේ නම්, හෝටල් ගොඩනැගිල්ල එහි ඉඩම අයිති රජයට පවරා රාජ්‍ය ඇපකරයන් යටතේ රජය විසින් ඉතිරි ණය මුදල් මිට්සුයි සහ තායිසේ වෙත බේරුම්කර, හෝටල් ගොඩනැගිලිවල වටිනාකම, HDL සමාගම විසින් රජයට ගෙවීමට පැහැර හැර ඇති ණය මුදල් වෙනුවෙන් හිලව් කර, HDL සමාගම ඈවර කරනවා හැරුනුවිට, අන් විකල්පයක් නොමැත.

(ඇ) පූර්වෝක්ත කාරණ ගෙනහැර දක්වනු ලැබ ඇත්තේ, තුඩු දී ඇති පරිද්දෙන් ක්‍රියා කිරීමේ රජයේ අයිතිවාසිකම්වලට අගතියක් නොවන පරිද්දෙනි.

21. (අ) හිල්ටන් හෝටලය පිහිටා ඇති අක්කර 7 රූඩ් 0 පර්චස් 12.5 ක විශාලත්වයෙන් යුතු ඉහත කී රජයේ ඉඩම්, ප්‍රධාන තක්සේරුකරු විසින් 99 වසර බද්දක පදනමක් මත 2005 අගෝස්තු මස දී රුපියල් මිලියන 4018 කට අගය කර ඇත.

(ආ) කෙසේ වෙතත් 1999 ජූලි සිට මෙම රජයේ ඉඩම්වලට HDL සමාගමට බද්දක් හෝ කිනම් ආකාරයකටවත් කිසිසේත්ම කිසිදු හෝ හිමිකමක් නොමැත.

(ඇ) HDL ගොඩනැගිලි සහ අනිකුත් වත්කම් ද ප්‍රධාන තක්සේරුකරු විසින් රුපියල් මිලියන 4,981 කට අගය කර ඇත.

2005.08.29 වන දින දරණ ප්‍රධාන තක්සේරුගේ වාර්තාව **"P14"** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් හා අන්තර්ගතවන්නක් ලෙස අයැද යා කරනු ලැබ ඇත.

22. (අ) 2005 ජූලි රජයේ යෝජනා හි ("P11") අනාවරණය කර ඇති ප්‍රකාර, මෙහි ඉහත 19(අ) ඡේදයේ දැක්වෙන පරිදි 2005.06.30 දිනට HDL සමාගම විසින් රජයට ගෙවීම් කිරීම පැහැර හැර ඇති ණය මුදල් 2006.06.30 දිනට නැවත ගණන් බැලූ කල්හි, එදිනට ගෙවීම පැහැර හැර ඇති ණය මුදල මෙසේ ය.

| ණය ගත් දිනය | මුල් මුදල (රු.) | පොලි අනුපාතිකය (%) වසරකට | පොලිය (රු.) |
|---|---|---|---|
| 1997.07.02 | 288,567,633 | 12.50 | 544,385,026 |
| 1999.07.12 | 469,742,070 | 12.50 | 601,597,422 |
| 2000.07.03 | 464,427,826 | 12.50 | 477,100,449 |
| 2001.06.29 | 360,618,876 | 18.56 | 484,152,925 |
| 2002.07.01 | 446,803,874 | 12.50 | 268,889,538 |
| 2003.07.04 | 340,024,378 | 9.40 | 105,182,659 |
| 2004.06.30 | 395,658,959 | 8.59 | 70,893,701 |
| 2005.06.30 | 225,639,338 | 10.28 | 23,195,723 |
| එකතුව | 2,991,482,954 | | 2,575,397,443 |

(ආ) ඒට අමතරව රජය ඇපකරු වශයෙන් රජය වෙත HDL සමාගම ණයගැනුම්කරු ලෙස ආපසු ගෙවිය යුතු වන්නාවූ මුල් මුදලින් මෙන්ම පොළී මුදලින් ද දෙකෙන්ම සමන්විත වන්නා වූ ඉහත කී ණය එකකදු වුවත්, 25% වාර්ෂික පොළියක, එනම් (ජපන් යෙන් එකකට ශ්‍රී ලංකා මුදලින් රුපියල් 0.914 බැගින් රුපියල් 502,479,.073 ක්) 2006.06.30 දිනට ජපන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීමට නියමිත වාරිකය ගෙවීමට, රජය විසින් සැහෙන මුදල් අත්තිකාරමක් ගෙවන්නට ඇත.

23. (අ) කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රමන්ත්‍රණ (NEGOTIATING) කමිටුව විසින් විධිමත්ව සකස් කළ පරිදි HDL සමාගම මූල්‍යමය වශයෙන් ප්‍රතිව්‍යුහකරණය කිරීම සඳහා වූ රජයේ යෝජනා කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර තිබුනි. මහභාණ්ඩාගාරයේ ලේකම් විසින් කර ඇති සාකච්ඡාවන්ට ආනුෂංගිකව සීමාසහිත කෝර්නල් සහ සමාගමට වෙන්කර පැවරීමට යෝජිත HDL කොටස් 1 1/2% අනුපාතිකය 4% දක්වා වැය කර ඇත.

(ආ) ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් පත්කළ ප්‍රමන්ත්‍රණ (NEGOTIATING) කමිටුව විසින් කර ඇති නිර්දේශයන් හි නියමයන් ප්‍රකාර, 2005 ජූලි මසදී රජය යෝජනා කළ ආකාරයෙන් ප්‍රතිව්‍යුහකරණයක් නොලහොත් HDL සමාගම ඈවර කරනවා විනා, අන් විකල්පයක් නොවනු ඇති බව කැබිනට් මණ්ඩලය තීරණය කර ඇත.

(ඇ) ඒ අනුව සහ එමගින් HDL සමාගමේ බහුතර අයිතිය රජය සතුව පවතින බැවින් HDL අධ්‍යක්ෂකවරුන් විශේෂයෙන් රජය විසින් නම්කර පත්කළ අධ්‍යක්ෂකවරුන්, එවැනි කැබිනට් මණ්ඩල තීරණයක් ක්‍රියාවට නැංවීමට බැඳී සිටිති.

(ඈ) රජය විසින් යෝජනාකර ඇති පරිද්දෙන් HDL සමාගම ප්‍රතිව්‍යුහකරණය කළ නොහැක්කේ නම්, ඇත්ත වශයෙන්ම දැන් යථාර්ථය එය වන්නේ ය. HDL සමාගමේ රජයේ අධ්‍යක්ෂකවරුන්වත්, එසේ නැතිනම් මහභාණ්ඩාගාරයේ ලේකම්වත්, HDL සමාගම ඈවර කිරීමේ කැබිනට් මණ්ඩල තීරණය ක්‍රියාවට නැංවීමට ක්‍රියාකර නොමැත.

(ඉ) වසර 6 ක කාලසීමාවක් තිස්සේ HDL සමාගමේ ගැටළු විසඳීමට සහ HDL සමාගම ප්‍රතිව්‍යුහකරණය කිරීමට ගත් උත්සහයන් නිෂ්ඵල වී ඇති බව ඔප්පුවී ඇති අතර, කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රමන්ත්‍රණ (NEGOTIATING) කමිටුව විසින් නිර්දේශ කරනු ලැබ කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇති පරිදි, HDL සමාගම ඈවර කරනු විනා, අන් ප්‍රතිකර්මයක් නොමැත.

24. පූර්වෝක්ත සත්‍යය සිද්ධිකාරණා කරණකොටගෙන,

(අ) HDL සමාගම ගොඩ ගැනීමේ අපේක්ෂාවක් තැබිය නොහැකි අරාජික තරමට බංකොලොත් වී ඇති අතර, එහි වත්මන් කටයුතු තත්වය අවධානයට ගත් කල් හි එය ක්‍රියාකාරී සමාගමක් ලෙස ප්‍රායෝගිකව මෙහෙයවිය නොහැක.

(ආ) HDL සමාගමේ පොදු කොටස් හිමියන්ට, HDL සමාගමෙන් කිසිදු හෝ ප්‍රති ලාභයක් ලැබී නොමැති අතර, ලැබීමට අපේක්ෂා කර සිටීමටද නොහැක.

(ඇ) ඒකාරාශිව ඇත්තාවූ රුපියල් මිලියන 6351.5 ක පාඩුවක් ද සහිතව HDL සමාගමේ රුපියල් මිලියන 452.2 ක කොටස් ප්‍රාග්ධනය 2005.06.30 දින මුළුමනින්ම සුනු විසුණු වී සෝදා පාළුවී ඇති අතර මේ වන විට තව තවත් පිරිහී ඇත.

(ඈ) 1999 ජුලි මස නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩම් රජයට පවාරණය කරන ලදුව, HDL සමාගමේ කොටස් ප්‍රාග්ධනය වන රුපියල් මිලියන 452.2 න් 99 වසරක බද්දකට ප්‍රතිජ්ඨාවක් වශයෙන් රුපියල් මිලියන 250.9 ක් නොගෙවා ඇති සේ පවතින අතර, එය නිෂ්ඵලදායි වී ඇත.

(ඉ) HDL සමාගමේ හෝටලයේ ගොඩනැගිලි පිහිටා ඇත්තේ දැන් HDL සමාගමට අයිති නොවන්නා වූ ඉඩම්වල වන අතර එම ඉඩම් සඳහා HDL සමාගමට බදු අයිතිවාසිකමක් හෝ කිනම් ආකාරයකටවත් හිමිකමක් නොමැත.

(ඊ) 5.25% ක වාර්ෂික පොලියක් මත 2005.06.30 දිනට ජපන් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.2,386,551,716 ක වැඩිදුර ණය මුදල් ද සහිතව, 2006.06.30 දිනට, මුල් මුදල (රු.2,991,482,954/-) සහ පොලී (රු.2,575,397,443/-) යන දෙකෙන්ම එකතුවුන රු.5,566,880,397 ක් වන අතිවිශාල ණය කන්දරාවක් රජයට ගෙවීමට HDL සමාගම විසින් පැහැර හරිනු ලැබ ඇත.
HDL සමාගම ඈවර කිරීම යුක්ති සහගත සහ සර්ව සාධාරණ වන්නේ ය.

*එහෙයින් පෙත්සම්කරු ගෞරව පූර්වකව ගරු අධිකරණයෙන් අයැද සිටිනු ලබන්නේ,*

(අ) හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගම ඈවර කිරීම යුක්තිසහගත සහ සර්ව සාධාරණ යන හේතු සාධකය මත එය ඈවර කිරීමට නියෝගයක් කරන ලෙසත්,

(ආ) ඉහත කී පූර්වායවයන්ට උචිත යයි ගෞරවනීය ඔබතුමාගේ අධිකරණයට හැඟී යන තවත් එවැනි සහ වැඩිදුර නියෝග හෝ නියමයන් කර සිටින ලෙසත් සහ

(ඇ) නඩු ගාස්තු ප්‍රදානය කරන ලෙසත් ය.

V. W. Kularatne Associates

පෙත්සම්කරුගේ නීතිඥවරුන්.

1. මෙම පෙත්සම හොටෙල් ඩෙවලපර්ස් ලංකා ලිමිටඩ් සමාගමට බාරකරවීමට අපේක්ෂා කර සිටී.

2. පෙත්සමට අමුණා එහි කොටසක් සහ අන්තර්ගතවනත් ලෙස අයැද ඇති ලේඛණ.

(1) ලේඛණගත නීතිඥවරුන් පත්කිරීම.

(2) හොටෙල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ් (HDL) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය. P1(a)

(3) ව්‍යවස්ථාවලිය සංශෝධනය කරමින් වූත 1990.12.21 දින යෝජනා සම්මුති. P1(b)

(4) අංක.673 සහ 1999.07.26 දින දරණ විශේෂ ප්‍රදාන පවාරණය කිරීමේ සාධන පත්‍රය. P2(a)

(5) අංක.674 සහ 1999.07.26 දින දරණ විශේෂ ප්‍රදාන පවාරණය කිරීමේ සාධන පත්‍රය. P2(b)

(6) HDL සමාගමේ පෙත්සම්කරුගේ 1984.05.31 දින දරණ කොටස් සහතිකය. P3

(7) මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 1999.05.25 දින දරණ ලිපිය. P4

(8) මහාධිකරණ (සිවිල්) 116/96(1), කොළඹ දි.උ. 3155/විශේෂ නඩුවේ ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය. P5(a)

(9) මහාධිකරණ (සිවිල්) 134/96(1), කොළඹ දි.උ. 3231/විශේෂ නඩුවේ ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය. P5(b)

(10) මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 1990.08.10 දින දරණ ලිපිය. P6(a)

(11) මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 1990.09.13 දින දරණ ලිපිය. P6(b)

(12) 2004.09.30 දින HDL අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව. P6(c)

(13) 2005.05.16 දින HDL විගණන කමිටු වාර්තාව. P6(d)

(14) නාගරික සංවර්ධන අධිකාරියේ 2005.02.18 දින දරණ ලිපිය. P7(a)

(15) නාගරික සංවර්ධන අධිකාරියේ 2005.09.07 දින දරණ ලිපිය. P7(b)

(16) කොළඹ දි.උ.4414/විශේෂ දරණ නඩුවට සී.එල්.පෙරේරා විසින් ගොනු කළ 1995.07.21 දින දරණ දිවුරුම් ප්‍රකාශය. P8

(17) සී.එල්.පෙරේරා වෙත විශේෂ ජනාධිපති කොමිසම විසින් නිකුත් කළ හේතු දැක්වීමේ නොතිසිය. P9

(18) මුදල් අමාත්‍යාංශයේ 2001.08.22 දින දරණ වාර්තාව. P10(a)

(19) මහභාණ්ඩාගාරයේ ලේකම්ගේ 2002.08.06 දින දරණ ලිපිය. P10(b)

(20) මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 2004.08.23 දින දරණ ලිපිය. P10(c)

(21) කැබිනට් මණ්ඩලය පත්කළ ප්‍රමන්ත්‍රණ කමිටුව විසින් අනුමත කර ඇති පරිදි වූ රජයේ යෝජනා. P11

(22) HDL සමාගමේ 2005.03.31 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තාව. P12

(23) මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ 1997.11.13 දින දරණ ලිපිය. P13(a)

(24) මහභාණ්ඩාගාරයේ ලේකම්ගේ 1999.08.17 දින දරණ ලිපිය. P13(b)

(25) මහභාණ්ඩාගාරයේ ලේකම්ගේ 2000.08.11 දින දරණ ලිපිය. P13(c)

(26) මහභාණ්ඩාගාරයේ ලේකම්ගේ 2001.07.30 දින දරණ ලිපිය. P13(d)

(27) මහභාණ්ඩාගාරයේ ලේකම්ගේ 2002.07.30 දින දරණ ලිපිය. P13(e)

(28) මහභාණ්ඩාගාරයේ ලේකම්ගේ 2003.09.23 දින දරණ ලිපිය. P13(f)

(29) මහභාණ්ඩාගාරයේ ලේකම්ගේ 2004.07.29 දින දරණ ලිපිය. P13(g)

(30) මහභාණ්ඩාගාරයේ ලෙකම්ගේ 2005.07.19 දින දරණ ලිපිය. P3(h)

(31) ප්‍රධාන තක්සේරුකරුගේ 2005.08.29 දින දරණ අගය වාර්තාව. P14

V. W. Kularatne Associates

පෙත්සම්කරුගේ නීතිඥවරුන්.

<u>සකස් කරන ලද්දේ,</u>

දිල්රුක්ෂි බොතේජු.

ශිවාන් කනග්-ඊශ්වරන්

එම්.ඒ.සුමන්දිරන්

නීතිඥවරුන්

ආචාර්ය හර්ෂා කබ්රාල් ජනාධිපති නීතිඥ

කේ.කනග්-ඊශ්වරන් ජනාධිපති නීතිඥ.

විසිනි.